// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2267/12 - 2022 පෙබරවාරි මස 14 වැනි සඳුදා - 2022.02.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### කුරුණෑගල පළාත් මහ රෝහල, ශික්ෂණ රෝහලක් ලෙස නැවත වර්ගීකරණය කිරීම

2017 අයවැය කථාව මගින් යෝජිත පරිදි ශ්‍රී ලංකාවේ වෛද්‍ය අධ්‍යාපනය පුළුල් කිරීමේ අරමුණින් නව වෛද්‍ය පීඨයක් ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ස්ථාපිත කෙරිණි.

වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ සිසුන්ට සායනික පුහුණුව සඳහා පහසුකම් සැපයීම සම්බන්ධයෙන් දැනට පවතින තත්ත්වය සලකා බලා ඔවුන්ට සායනික පුහුණුව සඳහා කුලියාපිටිය ශික්ෂණ රෝහලට අමතරව කුරුණෑගල පළාත් මහ රෝහල ද තෝරාගෙන ඇත.

ඒ අනුව, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ අභිනවයෙන් ස්ථාපිත වෛද්‍ය පීඨයේ සිසුන්ට සායනික පුහුණුව ලබාදීමට වහාම ක්‍රියාත්මක වන පරිදි කුරුණෑගල පළාත් මහ රෝහල, ශික්ෂණ රෝහලක් ලෙස උත්ශ්‍රේණිගතකර නැවත වර්ගීකරණය කරන ලදී.

| | |
|---|---|
| ආයතනයේ නම | ශික්ෂණ රෝහල - කුරුණෑගල |
| පරිපාලන දිස්ත්‍රික්කය | කුරුණෑගල |
| ඡන්ද කොට්ඨාසය | කුරුණෑගල |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | කුරුණෑගල |
| ආසන්නතම පරිපාලන කාර්යාලය | සෞඛ්‍ය අමාත්‍යාංශය |
| ආයතනභාර නිළධාරි | අධ්‍යක්ෂ |
| වාර්තා කළයුතු නිළධාරි | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් |
| තැපැල් හා විදුලි ලිපි කාර්යාලය | කුරුණෑගල |
| ආසන්නතම දුම්රිය ස්ථානය | කුරුණෑගල |
| පොලිස් ස්ථානය | කුරුණෑගල |

වෛද්‍ය එස්. එච්. මුණසිංහ,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

2022 පෙබරවාරි මස 14 වැනි දින.
අංක 385, "සුවසිරිපාය",
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

EOG 02 - 0481

1A - PG 5749— 110 (2022/02)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.